# ගෙවත්ත

## 5 ශ්‍රේණිය

## 10 වන පාඩම



මෙම සොඳුරු ගෙවත්ත කමල්ගේ ය. ඔහුගේ පවුලේ සියලුදෙනා ඉතා මහන්සියෙන් ගෙවත්ත නඩත්තු කරති. ගෙවත්තේ දිරාපත්වන කොළ රොඩු, මුළුතැන්ගෙයින් ඉවතලන දෑ යොදා සාදා ගත් කාබනික පොහොර යොදමින් දිනපතා ජල සම්පාදනය කරමින් ගෙවත්ත පවත්වාගෙන යයි. සතුන්ගෙන් බෝග ආරක්ෂා කරගැනීමට දඬු වැටක් ද සිටුවා ඇත. ඔබටත් මෙවැනි ගෙවත්තක් පවත්වාගෙන යතහොත් ඉන් ලැබෙන ප්‍රයෝජන ඉමහත් ය.

### <u>පාසල් වත්තේ / ගෙවත්තේ වගා කරමු.</u>

වගා කටයුතු ආරම්භ කිරීමට පෙර ගෙවතු වගාවට සම්බන්ධ මූලික කරුණු දැන ගැනීම ඉතා වැදගත් ය. ඒ අනුව.

1. වගා කළ යුතු බීජ සොයා ගැනීම.
2. වගා කළ යුතු බීජ තීරණය කිරිම.
3. වගා කරන ස්ථාන තෝරා ගැනීම.
4. ඉඩකඩ අවම නම් වගා බඳුන් සූදානම් කර ගැනීම.
5. ජලය යෙදීමට අවශ්‍ය උපදෙස් ලබාදීම.
6. දෙමාපිය සහයෝගය ලබා ගැනීම.

අප විසින් තීරණය කළ යුතුය.

### <u>ගෙවතු වගාවට සුදුසු බීජ තෝරා ගැනීම.</u>

කෙටි කාලයකින් එල දරණ බීජ වන බෝංචි, මෑ, බණ්ඩක්කා, කරවිල, වැටකොලු, තක්කාලි, මාළු මිරිස් වැනි බීජ තෝරා ගැනීම සුදුසු වේ. වගාවට සුදුසු වන්නේ හොඳින් මෝරා ඇති කෘමීන් හානි නොකළ, පළුදු රහිත, පෘෂ්ඨීමත් බීජ වේ.

මෙසේ තෝරා ගත් බීජ වීදුරු භාජන කිහිපයකට ජලය දමා ජලයේ ගිල්වා තබමින් ජලයේ ගිලෙන බීජ හා පාවෙන බීජ වෙන්කර ගත යුතුය. ඔබගේ දෙමාපිය සහාය ඇතිව සකස් කරන ලද පාත්තිවල හෝ විකල්ප බඳුන් යොදා ගනිමින් ජලයේ ගිලුණු බීජ පරතරයක් සහිතව පාත්තිවල ද ජලයේ පාවුණු බීජ කිහිපයක් සිටුවා ප්‍රමානවත් පරිදි දිනපතා ජලය යොදමින් බීජ පැළවීම නිරීක්ෂණය කළ හැකිය. ගෙවතු වගාව නමින් පොතක් පවත්වාගෙන යමින් නිරීක්ෂණ වාර්තා තබන්න. පාත්ති නඩත්තු කරන අයුරු ද වාර්තා තබන්න.

ඔබගේ ගෙවත්තේ සරු අස්වැන්න නිවසේ පරිබෝජනයට ගතහැකි අතර ඉතිරි කොටස විකුණා අමතර ආදායමක් ලබා ගත හැකි වේ.

## වගාවේ දී භාවිතා වන 3R සංකල්පය.

වගාවේ දී භාවිතා වන **3R** සංකල්පය පරිසරයට හිතකාමී, සංවර්ධනයට දායක විය හැකි සංකල්පයකි.

| | | |
|---|---|---|
| 1. භාවිතය අවම කිරීම. | **REDUCE** | |
| 2. නැවත භාවිතා කිරීම. | **REUSE** | **3R** සංකල්පය. |
| 3. ප්‍රතිචක්‍රීකරණය. | RECYCLE | |

1. භාවිතය අවම කිරීම.

නූඩ්ල්ස්, මීට් බෝල්ස්, සොසේජස්, රෝල්ස්, පැටිස් වැනි ක්ෂණික හා කෙටි ආහාර අවම කරමින් ගෙවත්තෙන් නෙළා ගන්නා ආහාර ගැනීමේ කැමැත්ත ඇතිකරවීම භාවිතය අවම කිරීම නම් වේ.

2. නැවත භාවිතා කිරීම.

භාවිතා කළ පොලිතීන් බෑග්, අපතේ හරින බට කොටස්, භාවිතා කළ දුව භාණ්ඩ කොටස්, බෝතල්. සෘජුෆෝම් කොටස්, භාණ්ඩ අසුරා එන ඇසුරුම් කොටස් වගාව සඳහා යොදා ගැනීම නැවත භාවිතා කිරීම නම් වේ. මෙහිදී එක් දෙයකට භාවිතා කළ දෙයක් තවත් දෙයකට භාවිතා කිරීම ඉතා වැදගත් බව පෙනේ.

3. ප්‍රතිචක්‍රීකරණය.

අපතේ යන ප්ලාස්ටික් බේසම, බහාලුම් මගින් වගාවට උචිත ලෙස බඳුන් සකස් කර වගාවට යොමු කර ගනියි.

"දෛනික ජීවිතයේ දී අප භාවිතයෙන් බැහැර කරන දේ නැවත නැවත භාවිතා කළ හැකි තත්ත්වයකට පත්කර ගැනීම තමාට මෙන්ම සමාජයටත් ඉතා වැදගත්කමකින් යුතු ක්‍රියාවක්" බව මෙමඟින් පෙන්වයි.

## බෝග වගාවට හිතකර හා අහිතකර සත්තු.

ඔබ දිනපතා නිසි ලෙස නඩත්තු කරන වගාවේ නිතර ගැවසෙන සතුන් දැක ඇත. මේ සතුන් අතර වගාවන්ට හිතකර හා අහිතකර සතුන් ද දක්නට ලැබේ. මේ ඉන් සමහරකි.

| බෝග වගාවට හිතකර සත්තු | බෝග වගාවට අහිතකර සත්තු |
|---|---|
| ගැඩවිලා | කුරුමිණියා |
| බකමූණා | පුරුක්පණුවා |
| සමනළයා | කීඩෑවා |
| මී මැස්සා | ගොළුබෙල්ලා |
| බඹරා | කටුස්සා |
| | දළඹුවා |
| | පිටි මකුණා |
| | පැළ මැක්කා |

## බෝගවලට වැළඳෙන රෝග.

බෝග කිහිපයකට වැළඳෙන රෝග හා ඊට යෙදිය හැකි පරිසර හිතකාමී පිළියම් පහත වගුවේ දැක්වේ.

| | බෝගය | වැළඳී ඇති රෝගය | යෙදිය හැකි පිළියම් |
|---|---|---|---|
| 1. | කෙසෙල් | වඳපීදීම | රෝගී පැළ උදුරා පිළිස්සීම, රෝගී ශාකවල භූගත කොටස් විනාශ කිරීම. |
| 2. | බණ්ඩක්කා වට්ටක්කා | පත්‍ර විචිත්‍රය (පත්‍ර මත කොළවන් කහ පුල්ලි) | රෝගී ශාක වගාබිමෙන් ඉවත් කර පිළිස්සීම, බෝග මාරුව. |
| 3. | කැරට් ගෝවා | මුල් ගැට රෝගය (මුල්වල ගැටිති ඇතිවිට පත්‍ර කහ වී පැළ මැල වී යාම) | බෝගය සිටුවීමට පෙර වගා බිමෙහි දහස්පෙතියා සිටුවීම. |

| | | | |
|---|---|---|---|
| 4. | තක්කාලි | දියමලන් කෑම (කඳ පසෙන් උඩට මතු වන විටම කුණු වීම) | පාත්ති දැමීමේ දී පැළ අතර පරතරය වැඩි කිරීම. |
| 5. | කරවිල, වැටකොලු, පතෝල, ලබු, මිරිස්, බටු, තක්කාලි | හිටු මැරීම (අවට පැළ නිරෝගීව තිබිය දී ශාක මැල වී පසුව මිය යාම.) | රෝගී ශාක ඉවත් කිරීම, බෝග මාරුව. |
| 6. | මිරිස් | කොළ ගොඩවීම. | ඇලෙන සුළු උගුල් ඇටවීම, ආවරණ කිරීම. |

## <u>වගා කටුයතුවලදී අස්වැන්න නාස්ති වන අවස්ථා.</u>

<u>අස්වැන්න ආරක්ෂා කරගත හැකි ආකාරය.</u>



අතින් අස්වැන්න නෙලීම.



රෝග වැළඳීම.

වගා කටයුතුවලදී විවිධ හේතු මත අස්වැන්න නාස්ති වේ. එසේ <u>ආහාර නාස්ති වන ආකාර</u> පහත දක්වේ.

| | | |
|---|---|---|
| 1. | විවිධ රෝග වැළඳීමෙන්. | තක්කාලි/ගෝවා/මිරිස් |
| 2. | අධික වැසිවලට හසුවීමෙන්. | වී/තල/එළවළු |
| 3. | නියඟයට හසුවීමෙන්. | එළවළු |
| 4. | සතුන්ගෙන් සිදුවන හානිවලින්. | කෙසෙල්/ගොයම්/අල/බතල |
| 5. | නිසිකලට අස්වැන්න නෙළාගත නොහැකි වීමෙන්. | රඹුටන්/කෙසෙල්/පේර |
| 6. | නෙළාගත් අස්වැන්න නියමිත පරිදි ගබඩා කර ගැනීමට නොහැකි වීමෙන්. | එළවළු/වී/කෙසෙල් |
| 7. | එල බිමට කැඩීම නිසා. | අඹ/පැපොල් |
| 8. | වෙනත් (අතින් අස්වනු නෙළීමේ දී) | වී |

මෙසේ විවිධ හේතු මත අස්වැන්න නාස්ති වීම වළක්වා ගනිමින් <u>අස්වැන්න ආරක්ෂා කර ගැනීමට</u> නම්,

1. නියමිත කාලයට අස්වැන්න නෙළාගත යුතුය.
2. නෙළාගත් අස්වැන්න ආරක්ෂිතව ගබඩා කළ යුතුය.

3. වී අස්වැන්න නම් ගෝනිවල දමා වතුර හා සුළං නොවැදෙන සේ සුදුසු ස්ථානයක තැබිය යුතුය.
4. එළවළු එකින් එක නොගැටෙන, නොතැලෙන ලෙස තිබිය යුතුය.
5. කෘමීන්ගෙන් පැමිණෙන හානි වළක්වා ගැනීමට කොහොඹ ඇට නිස්සාරණය භාවිතා කාරීම සුදුසුය.
6. සතුන්ගෙන් වන හානි වළක්වා ගැනීමට ආරක්ෂිත වැටවල් ඉදිකිරීම කළ යුතුය.
7. බෝගවලට ආවරණ යෙදිය යුතුය.

## නිවස අලංකාර කරගත හැකි බඳුන්ගත වගාව.





- ✓ විනිවිද පෙනෙන හිස් බෝතලයක් හෝ බඳුන්.
- ✓ දහස්පෙතියා/කුඩලු මල් පැළ කිහිපයක්.

- බෝතලයේ පතුල ඉවත් කර මූඩිය ද ඉවත් කර බෝතලයේ කටෙන් මල් පැළයේ මුල් ඇතුල් කරන්න. (ඉවත් කළ පතුලන් පැළයේ කඳ කොටස එළියට එන සේ.)
- බෝතලයේ කට යටට හරවා මුල් ආවරණය වන සේ පොහොර සහිත පස් බෝතලයට දමා පතුල ඉවත් කළ තැනින් දෙපස සිදුරු කර කම්බියකින් ගැට ගසා හොඳින් හිරු එළිය වැටෙන සේ උස් ස්ථානයක එල්ලන්න.
- දිනපතා ප්‍රමාණවත් ලෙස ජලය යොදමින් නිරීක්ෂණය කර වාර්තා තබා ගන්න.
- ශාකය ඉහළට නැමෙන අයුරු නිරීක්ෂණය කරන්න.

මෙම බඳුන්ගත වගාක්‍රමය යොදා ගනිමින් ඔබේ නිවස අලංකාර කර ගැනීමට මාළු මිරිස්/තක්කාලි/මිරිස් වැනි වගාවන් කළ හැකිය.

## ගෙවතු වගාව ආරක්ෂාව සඳහා යොදාගත් සාම්ප්‍රදායික ක්‍රම ශිල්ප.

අතීතයේ ගෙවතු වගාව ආරක්ෂා කර ගැනීම සඳහා සාම්ප්‍රදායික ක්‍රමශිල්ප භාවිතා කර ඇත. එම ක්‍රමවල විශේෂත්වය වන්නේ පරිසර හිතකාමී වීමයි. එම ශිල්ප ක්‍රම අතර,

1. වගාවන් සඳහා අළු යෙදීම.
2. පඹයන් සිටුවීම.

3. කොහොඹ ඇට දියර භාවිතය.

4. ටකයක් ගැට ගැසීම.

5. කුරුල්ලන් එළවීම සඳහා බඹර පෙත්තක් යොදා ගැනීම.

6. දඬු වැටක් සැකසීම.

7. වගා බිමේ දහස්පෙතායා සිටුවීම.

8. පිට වැට කැපීම (පිට සිට ඇතුළ කැපීම).

9. කජු ලෙලි, මදුරුතලා, දහස්පෙතියා, කොහොඹ කොළ වැනි දෑ පුළුස්සා දුම් ගැසීම.

10. රැහැන් එල්ලා සතුන්ගේ ගමනට බාධා කිරීම.

11. යටිකුරු V හැඩයේ පන්දලම් භාවිතය.

ඉන් සමහරකි.

## හේන් ගොවිතැන.

ශ්‍රී ලංකාවේ මුල්ම ගොවිතැන හේන් ගොවිතැනයි. වර්තමානයේ ද වියළි කලාපයේ සමහර ප්‍රදේශවල හේන් ගොවිතැන සිදු කරයි. වර්ෂාපතන රටාව තේරුම් ගෙන පවුලේ ශ්‍රමය යොදා ගනිමින් හේන් ගොවිතැන සිදු කරයි.

මෝසම් වැසි ආරම්භයට පෙර (ජූලි-අගෝස්තු) කැළෑව කපා එළි පෙහෙළි කරයි. හේන් වගාවට පෙර බිම සකස් කිරීමේ දී භූමිය පුළුස්සා දැමීමට පෙර එහි සිටින සතුන් පළවා හැරීම සිදු කෙරේ. එහිදී,

"බඩගාන සතුන්, කුරගාන සතුන් සියලු දෙනා ම හේනෙන් පලෝ.................. හූ ..... හූ...... හූ......." යනුවෙන් කෑගසමින් සතුන් පළවා හැරීම එකල හේන් ගොවියා සතුන් කෙරෙහි දැක් වූ ආදරය පෙන්වන්නකි.

බීජ සිටුවීමට හෝ වැපිරීමට තනි බීජ වර්ගයක් හෝ බීජ වර්ග කිහිපයක් මිශ්‍ර බෝග සිටුවීම (කුරක්කන්/ඉරිඟු/කව්පි/මුං/තල/මෙනේරි) සිදු කරයි. හේන පිළිස්සූ විට ඉතිරි වන දැව දඬු යොදා දඬුවැට සකස් කරන අතර අලුතින්ම ගිනිතබා ආරම්භ කරන හේන <u>නව දූලිහේන</u> නම් වේ.

බීජ සිටුවා අස්වද්දා පිටව යන දවසට පහන් පැළක් තැනීම, දෙවියන්ට පින් දීම සිදු කරයි. හේන් වගාව ආරම්භ වූ පසු අස්වැන්න ආරක්ෂා කර ගැනීමට,

1. පිරිත් පැන් ඉසීම.

2. පරණ සෙරෙප්පු පුච්චා මල්වල තැවරීම.

3. පටි ඇදීම.

4. අද්දර තැළීම (වගාවෙන් පිටත කැලේ කොටස තැළීම)

5. ගිනි මැල ගැසීම.

6. පැල් කවි කීම සිදු කරයි.

සෑම හේනක ම විශාල ගසක් මත පැළක් ඉදිකර ඇති අතර හේන් වගාව ආරම්භ වූ පසු වගාව සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීමට හේනේ පැලේ පැල් රැකීම සිදු කරයි. එහි දී තම සිතට දැනෙන පාළුව කාන්සිය දුරු කර ගැනීමට පැල්කවි ගායනා කරයි.

| | |
|---|---|
| උණ දඬු කපන තැන උණදඬු | රිකිල්ලා |
| බට දඬු කපන තැන බටදඬු | රිකිල්ලා |
| වතුර බසින තැන හොල්මන් | කුරුල්ලා |
| සී පද කියන්නට කවුරුත් | වරෙල්ලා |


| | |
|---|---|
| හෙනේ පැලේ මා විඳිනා | සුරුක්කන් |
| ගෝනෙක් ඇවිත් මට කරනා | නරක්කන් |
| වැටටත් උඩින් උන් අල්ලන | මලක්කන් |
| අපොයි මගේ කිරි වදිනා | කුරක්කන් |

මෙසේ රැක ගන්නා හේනෙන් ලබාගන්නා මුල් අස්වැන්න බුදුන්ට හා දෙවියන්ට පූජා කිරීම සිදු කරයි.

## ගෙවත්තේ වගා කරන බෝගවල ඉවත දමන කොටස් වලින් නිර්මාණ කිරීම.

උදා :- වට්ටක්කා ඇට, ලූනු පොතු, පොල් ලෙලි, දහයියා, පොල් කටු, පොල් මටලු, පුවක් ලෙලි........

01. කෝප්පය.




පොල් කටු 2

ඇට වර්ග

හොඳින් පිරිසිදු කරගත් පොල් කටු 2 ක් ඉහත අයුරින් සකස් කර හොඳින් ඇලවෙන ගම් වර්ගයකින් පතුල හා කොක්ක අලවා වර්ණ කරන්න.

අපතේ යන ඇටවර්ග අලවා අලංකාර කරන්න.

02. පැන්සල් රඳවනය.



පොල්කටු 2

උණ පතුරු

(ලී පතුරු)

ඉහත පරිදි කුඩා හා සාමාන්‍ය පොල් කටු 2 ක් සුද්ද කර ඉහත පරිදි සකස් කර ගන්න.

ප්‍රමාණවත් පරිදි ලී පතුරු (උණ පතුරු) 4ක් අලවා වර්ණ ගන්වා අපතේ යන ඇට වර්ග අලවා අලංකාර කර ගන්න.

03. ඔබ කැමති වෙනත් නිර්මාණයක් කරන්න.

## බෝගවල නම් යොදා ගෙන නිර්මාණාත්මක ක්‍රීඩාවක නියැලෙමු.

- එළවළු නිර්මාණය කිරීමට අවශ්‍ය සිසුන් ගණන පළමුව සිතා කණ්ඩායම් කිරීම.
- කණ්ඩායම් දෙකක් පේළි දෙකක සිටුවා කණ්ඩායමට ඉදිරියේ සිට එළවළුවක නමක් ගුරුවරයා ප්‍රකාශ කිරීම.
- කණ්ඩායමේ සිසුන් එළවළුවේ හැඩය නිර්මාණය කර පෙන්වීම.
- ගුරුවරයා එළවළුවේ නම වෙනස් කළ විට කණ්ඩායම එළවළුවේ හැඩය වෙනස් කිරීම.
- එළවළුවේ හැඩය වෙනස් කිරීමට හා අදාළ හැඩය හොඳින් නිරූපණයට ලකුණු පිරිනමා වැඩිම ලකුණු ලබාගත් කණ්ඩායම ජයග්‍රහණය හිමි වන බව දැන්වීම.

## වගා කටයුතු හා ගෙවතු වගාවේ අගය ඉස්මතු වන ගීත ගායනා කරමු.

- රන්වන් දූන් කරලින් පැහිලා - නැමිලා බර වීලා

  තල වැවිලා රමණී සෝබා - කෙත්වතු පිරිලා සාරා

  ගායනය - ධර්මදාස වල්පොළ/ලතා වල්පොළ

- ගමින් ගමට සතුට උදා වේ (ගායනය - මහාචාර්ය සනත් නන්දසිරි)

- කැලේ හැදෙන කිරි මදු වැල් කාපල්ලා (ගායනය - හර්ෂණ දිසානායක.)

- ලෝකෙන් උතුම් රට ලංකාවයි (ගායනය - අයි.එම්.ආර්.ඒ. ඊරියගොල්ල.)

සැකසුම :- ඩබ්.ඩී.එන්. වික්‍රමනායක.

කෑ/මාව/ කෙහෙල්පන්නල ක.වි.

මාවනැල්ල අධ්‍යාපන කලාපය